# දැන්වීමයි

# රාජ්‍ය සේවා කොමිෂන් සභාව - දකුණු පළාත

## දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන නීති නිලධාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන නීති නිලධාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. මූලික සුදුසුකම්**

**1.1. අධ්‍යාපන සුදුසුකම්**

I විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිව්රුම් දී තිබීම හෝ නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය සමත්ව ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිව්රුම් දී තිබීම.

II විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**1.2. පළපුරුද්ද**

I ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු සහ නොතාරිස්වරයෙකු වශයෙන් දිව්රුම් දී වසර 15 කට නොඅඩු කාලයක් ගතවී තිබීම සහ අවම වශයෙන් වසර 10 ක් අධිකරණයේ නීතිඥයෙකු වශයෙන් සේවය කර සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

- ඉහත 1.1 අධ්‍යාපන සුදුසුකම් අංක II යටතේ දක්වා ඇති සුදුසුකම සපුරා නොමැති අයදුම්කරුවන්ගේ පළපුරුද්ද සහ නීති ක්ෂේත්‍රයේ අධිකරණ රාජකාරී පිළිබඳ ඇති ප්‍රවීණතාවය අනුව මෙම තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ

**2. වෙනත් සුදුසුකම්**

I. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

II. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු අධ්‍යාපන, වෘත්තීය හා අනෙකුත් සුදුසුකම්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි**

I. වසර 05ක් හෝ විධිමත්ව නිලධාරියෙකු පත් කරන තෙක් යන අවස්ථා දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සිදුකරනු ලබන අතර, මෙම පත්වීම නිලධාරියාගේ කාර්ය සාධනය මත පදනම්ව නියමිත කාල සීමාව තුළ වාර්ෂිකව දීර්ඝ කරනු ලැබේ.

II. මෙම තනතුර සඳහා ගෙවනු ලබන දීමනාව පිළිබඳ සාකච්ඡා කර තීරණයකට එළඹිය හැකිය.

III. මෙම තනතුර සඳහා වූ බඳවා ගැනීමට අදාළ රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ද ඇතුළුව ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, දකුණු පළාත් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයට ද, මුදල් රෙගුලාසි වලට ද, දකුණු පළාත් මූල්‍ය රීති සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හා රජය හා දකුණු පළාත් සභාව විසින් පනවනු ලබන වෙනත් විධිවිධාන වලට ද යටත් විය යුතු ය.

**4. වයස් සීමාව**

අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 60 නොඉක්මවිය යුතු ය.

**5. බඳවා ගැනීමේ ක්‍රමය**

නිවේදනයේ දක්වා ඇති සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ඉහළම ලකුණු ලැබූ අයදුම්කරු මෙම තනතුරට බඳවා ගනු ලැබේ.

**6. අයදුම් කිරීමේ ක්‍රමය**

I. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය (ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියක් www.psc.sp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක.). සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.12.17 වැනි දින හෝ එදිනට ප්‍රථම "ලේකම්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 6 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, ගාල්ල." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "ප්‍රධාන නීති නිලධාරී තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතු ය.

II. මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් වලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය.සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

III. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයේ ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් අවසාන තීරණය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.තව ද නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණය ද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

IV. සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු බඳවා ගැනීම් කිරීම හෝ නොකිරීම පිළිබඳ අවසාන තීරණය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

V. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය – 2021.12.17

7. අයදුම්කරු විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,**
**ගාමිණී වීරවික්‍රම,**
**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත.**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

## ආදර්ශ අයදුම්පත්‍රය

### දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**දකුණු පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රධාන නීති නිලධාරී තනතුර සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම - 2021**

01. 1.1 මුලකුරු සමග නම (සිංහලෙන් / දෙමළෙන්) : ..............................

1.2 මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන්) : ..............................

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | |

02. 2.1 ස්ථිර ලිපිනය : ..............................

2.2 දුරකථන අංකය : ජංගම : .................. ස්ථාවර : ..................

03. ස්ත්‍රී / පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

04. උපන් දිනය : වර්ෂය : .................. මාසය : .................. දිනය : ..................

4.1 2022-01-01 වැනි දිනට වයස : අවුරුදු : .................. මාස : .................. දින : ..................

05. සුදුසුකම් :

5.1 අධ්‍යාපන සුදුසුකම්/ වෘත්තීය සුදුසුකම් : ..............................

5.2 පළපුරුද්ද : ..............................

5.3 අතිරේක අධ්‍යාපන සුදුසුකම් : ..............................

5.4 අතිරේක වෘත්තීය සුදුසුකම් : ..............................

5.5 අතිරේක පළපුරුද්ද : ..............................

5.6 පරිගණක සාක්ෂරතාවය : ..............................

5.7 ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය : ..............................

06. අයදුම්කරුගේ සහතිකය

.............................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සඳහන් කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් දකුණු පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රධාන නීති නිලධාරී තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද, මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳකාරවම දනිමි.

දිනය : .................. ..............................

අයදුම්කරුගේ අත්සන

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

(අනවශ්‍ය වචන කපා හරින්න)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ..............................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ ඇය .................. වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

අත්සන සහතික කරන අයගේ නම : ..............................

අත්සන : ..............................

තනතුර හා නිල මුද්‍රාව : ..............................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු /නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ රු.32,960/- මූලික වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වේ.)